# ඔබට අවශ්‍ය ගොවිපල් යන්ත්‍ර මිළදී ගත යුත්තේ කෙසේද ?

ඔබත් ඔබේ ගොවිපලට යන්ත්‍රයක් මිළදී ගැනීමට බලාපොරොත්තුවෙන් සිටින කෙනෙක් විය හැක. එසේ නම් ඔබේ යන්ත්‍රය තෝරා ගැනීමට පෙර සලකා බැලිය යුතු කරුණු මොනවාදැයි හරි හැටි ඔබ සිතා බැලුවෙහිද? උදාහරණයක් ලෙස ඔබේ ගොවිපලට වතුර පොම්පයක් අවශ්‍ය වී ඇතැයි සිතමු. පොම්පයක් මිළදී ගැනීමේ අදහසින් වෙළඳ පොළට පිවිසෙන ඔබට නොයෙක් මාදිලියේ වතුර පොම්ප ඉතාමත් තරඟකාරී මිළට අලෙවිය සඳහා තබා ඇති අයුරු දැක ගත හැක. "සමහර වතුර පොම්ප විශාලය සමහර ඒවා කුඩාය. සමහර වතුර පොම්ප ක්‍රියාත්මක වනුයේ විදුලි බලයෙනි. තවත් සමහර වතුර පොම්ප ක්‍රියාත්මක කරන සෑම වාරයකදීම පුරනය (පොම්පය ජලයෙන් පිරවීම) කළ යුතුය."

කුන්ඩසාලේ ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලයේ කෘෂිකර්ම ඉංජිනේරු විද්‍යාව පිළිබඳ කථිකාචාර්ය

**එම්. ඩබ්. කේ. සී. ද සිල්වා**

වතුර පොම්ප පමණක් නොව ඔබ මිළදී ගැනීමට අදහස් කරන ඕනෑම ගොවිපල යන්ත්‍රයක් මේ ආකාරයෙන් විවිධ මෝස්තර වලින් හා විශේෂාංගයන්ගෙන් සමන්විතව ඇත. මෙවැනි විවිධ යන්ත්‍ර හැකියාව (Performance) අතින් පමණක් නොව, භාවිතා කිරීමේ පහසුව නඩත්තුව අමතර කොටස් ලබාගැනීමේ හැකියාව හා අලුත් වැඩියා කරන ආකාරය ආදී කරුණු අනුව ද විවිධ විය හැක. එහෙයින් යන්ත්‍රය කුමක් වුවත් එය මිළදී ගැනීමේ තීරණයට එළඹීමට පෙර පහත සඳහන් කරුණු ගැන විමසිලිමත් වීම, ඔබගේ අවශ්‍යතාවයට ගැලපෙන ගොවිපල යන්ත්‍රයක් තෝරා ගැනීමට පිටු වහලක් විය හැක.

- ○ ගොවිපලෙහි වපසරිය කොපමණද?
- ○ යන්ත්‍රය ප්‍රධාන වශයෙන් භාවිතා කිරීමට බලාපොරොත්තු වන්නේ කුමන කාරියක් සඳහාද?
- ○ පුද්ගලයින් කීදෙනෙකු මෙම යන්ත්‍රය පරිහරනය කිරීමට බලාපොරොත්තු වන්නෙහිද?
- ○ ප්‍රධාන ක්‍රියාකරු කවුද?
- ○ එක් වර්ෂයකදී භාවිතා කිරීමට බලාපොරොත්තු වන පැය ගණන දල වශයෙන් කොපමණද?
- ○ මෙම යන්ත්‍රය භාවිතා කරනුයේ ඔබ පමණක්ද? / නැතහොත් කුලියට දීමට බලාපොරොත්තු වන්නෙහිද?
- ○ මෙවැනි යන්ත්‍ර අලුත් වැඩියා කරන වැඩ පොලක් ඔබ වාසය කරන ප්‍රදේශයේ තිබේද?
- ○ යන්ත්‍රයේ මිළ හා ගෙවීමේ පහසුකම් මොනවාද?

**ගොවිපල යන්ත්‍ර පිළිබඳ දැනුම ලබාගන්නේ කෙසේද?**

ගොවිපල යන්ත්‍රයක් මිළදී ගැනීමට පෙර එම යන්ත්‍රය පිළිබඳව පුළුල් දැනුමක් ඔබ සතුව තිබීම වැදගත් වේ. මෙහි ප්‍රථම පියවර වශයෙන් විවිධ වර්ගයේ ගොවිපල යන්ත්‍ර අලෙවි කරනු ලබන වෙළඳ සැල්, ආයතන හා ඒවායේ මිළ ගණන් පිළිබඳ දැනුමක් ඔබ ලබාගත යුතුය. ඔබට අවශ්‍ය ගොවිපල යන්ත්‍රය ඔබේ ආර්ථික තත්වයට ගැලපෙන පරිදි මිළදී ගැනීමේදී වෙළෙන්දන්ගේ ප්‍රචාරක දැන්වීම් මත පමණක්ම විශ්වාසය තැබිය නොහැක. එහෙයින් ගොවිපල යන්ත්‍ර අලෙවි කරනු ලබන වෙළඳ සැල් හෝ ආයතන වෙත ඔබ පෞද්ගලිකව ගොස් ඔබට අවශ්‍ය යන්ත්‍රයේ සියලු වතගොතු හා මිළ ගණන් ඔවුන් ලවා පැහැදිලි කරවා ගැනීම සුදුසු වේ. එකම යන්ත්‍රය වුවද විවිධ වෙළඳසැල්වල විවිධ මිළ ගණන් යටතේ නොයෙක් විශේෂාංග-යන් සහිතව අලෙවි කරන බැවින් එම යන්ත්‍රයේ මිළ, එහි විශේෂාංග, ගෙවීමේ පහසුකම් හා වෙනත් තොරතුරු, අදාල වෙළඳ සැල්වල නාමයන් යටතේ වෙන වෙනම සටහන් කර ගත යුතුය. මීට අමතරව අදාල යන්ත්‍රය වෙනු-වෙන් ඔවුන් විසින් නොමිළේ සපයන පත්‍රිකා, අත්පොත්, දැන්වීම් ආදිය ඇත්නම් ඒවා ද ලබා ගත යුතුය. මෙසේ රැස්කරගත් මිළ ගණන් හා තොරතුරු පසුව තම නිවසට ගෙන ගොස් ඒවා එකිනෙක සංසන්දනය කිරීමෙන් යන්ත්‍රය පිළිබඳ වෙළඳ පොළේ පවතින තත්වය ඔබට අවබෝධ කරගත හැක. මෙසේ ලබාගත් තොරතුරු එකිනෙක විශ්ලේෂනය කිරීමේදී යම් පරස්-පරතාවයක් හෝ අපැහැදිලි කරුණක් ඇත්නම් වහාම අදාල වෙළඳ සැලට ගොස් ඒ පිළිබඳ නැවත විමසීම යෝග්‍ය වේ. විශේෂයෙන් ගොවිපල යන්ත්‍ර පිළිබඳව නිවැරදි තොරතුරු හෙළි කිරීම ඒවා අලෙවි කරන වෙළෙන්දන්ගේ යුතුකම වන හෙයින් එවැනි තොරතුරු නිවැරදිව ප්‍රකාශ කිරීමට යම් වෙළෙන්දෙක් මැලිවේ නම් එවැනි වෙළඳ සැල් ගොවිපල යන්ත්‍ර මිළදී ගැනීමට නුසුදුසු ස්ථාන වශයෙන් නම් කළ හැක.

ගොවිපල යන්ත්‍ර පිළිබඳ දැනුම ලබා ගැනීමෙ දෙවන පියවර වශයෙන් ඔබ කළ යුතුව ඇත්තේ ඒ පිළිබඳ නිවැරදි තාක්ෂණික උපදෙස් ඔබ වෙතට ලබාදීමට ඇපකැපව සිටින කෘෂිකර්ම ව්‍යාප්ත සේවයේ සහාය ලබාගැනීමය. මේ පිළිබඳව ඔබ ප්‍රදේශයේ කෘෂිකර්ම ව්‍යාප්ත සේවා නිළධාරීන්, කෘෂිකර්ම පර්යේෂණ ආයතන හෝ වෙනත් එවැනි ප්‍රාදේශීය මට්ටමේ හෝ ජාතික මට්ටමේ ආයතන වෙත ගොස් අදාළ නිළධාරීන් මුණගැසී ඔබ මිළදී ගැනීමට බලාපොරොත්තුවන යන්ත්‍රය පිළිබඳ තොරතුරු ඔවුන් ගෙන් විමසීමය. යන්ත්‍රය පිළිබඳ වෙළඳ පලෙහි පවතින සැබෑතත්වය ඔබ දැනටමත් අධ්‍යයන කොට ඇති බැවින් එම තොරතුරු ද අදාල නිළධාරීන් හමුවේ තැබීමෙන් මේ පිළිබඳව ඔබ පවත්වන සාකච්ඡාවන් වඩාත් ඵලදායී විය හැක. අනුරාධපුර පිහිටි ගොවිපල් යාන්ත්‍රික අභ්‍යාස මධ්‍යස්ථානයෙන් සහ මහඉලුප්පල්ලම පිහිටි ගොවිපල් යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථාන යෙන්ද ඔබට තොරතුරු ලබාගත හැක.

තුන්වන පියවර වශයෙන් ඔබ කළ යුතුව ඇත්තේ, දැනට මෙවැනි යන්ත්‍ර භාවිතා කරන ඔබේ අසල්වැසි ගොවි මහතුන් හෝ මිත්‍රයින් මුණගැසීමය. මෙවැනි යන්ත්‍ර භාවිතා කිරීමෙන් ඔවුන් ලබා ඇති අත්දැකීම්, ගැටලු, දුෂ්කරතා, ප්‍රයෝජන හෝ වාසි අවාසි ඔබට ඉතාමත් වැදගත් වන හෙයින් ඒ පිළිබඳව ඔවුන් සැළ කර සිටින කරුණු සාවදානව අසා සිටීම වඩාත් යෝග්‍ය වේ. කෙසේ වුවද ඔවුන් දැනට එම යන්ත්‍රය භාවිතා කරනු ලබන තත්වය, ඔබ යන්ත්‍රය භාවිතා කිරීමට බලාපොරොත්තු වන තත්වයට වඩා වෙනස්විය හැකි බැවින්, ඒ පිළිබඳව විමසිලිමත්වීම වටී. මෙහිදී ඔවුන් යන්ත්‍රය භාවිතා කරන තත්වය, කාලසීමාව, නඩත්තුවේ ආකාරය ආදී කරුණු විශේෂයෙන් හැදෑරීම නුවනට හුරුවේ.

**යන්ත්‍රය මිළදී ගැනීමට පෙර සලකා බැලිය යුතු ප්‍රධාන කරුණු**

ඉහතින් සඳහන් කළ පරිදි නොයෙක් විස්තර වලට සවන්දීමෙන්, උපදෙස් ලබා ගැනීමෙන්, පොත්පත් පත්‍රිකා ආදිය කියවීමෙන් සහ ඔබ විසින්ම සොයා ගන්නා ලද තොරතුරුද සැලකිල්ලට ගැනීමෙන් පසු පහත සඳහන් කරුණු නැවත විමසා බැලීම සුදුසු වේ.

### ආර්ථික කරුණු

- යන්ත්‍රයේ මිළ සහ එහි ගෙවීමේ පහසුකම්
- යන්ත්‍රය ක්‍රියා කිරීම පිළිබඳ වියදම. එනම් ඉන්ධන, ලිහිසි තෙල්, අමතර කොටස්, ක්‍රියාකරුගේ වේතන (අදාලවේනම්) ආදිය.
- නිතර නිතර අලුත් කළයුතු කොටස් වල ජීව්‍ය කාලය හා එම කොටස්වල මිළ ගණන්.
- යන්ත්‍රයේ මුලු ජීව්‍ය කාලය.
- යන්ත්‍රයේ කාර්යක්ෂමතාවය.

### යන්ත්‍රයේ හැකියාව සහ එහි කල් පැවැත්ම

- හැකියාව පිළිබඳ ස්ථාවරත්වය, නිර්දේශිත තත්වයන්ට වඩා ස්වල්ප වශයෙන් වෙනස් තත්වයන්හිදී පවා අදාල හැකියාව (Performance) ලබාගත හැකිද යන්න.
- විශ්වාසවන්ත භාවය, නිතර නිතර කරදර ඇති වේද? එසේ නම් විශේෂයෙන් කුමන කොටස්වලද?
- උපදෙස් පත්‍රිකා වල සඳහන් වන පරිදි මෙම යන්ත්‍රය විවිධ කාර්යයන් සඳහා යොදාගත හැකිද යන්න (සමහර අවස්ථාවන්හිදී ප්‍රචාරක පත්‍රිකා වලදී ඇති පොරොන්දු සත්‍ය වශයෙන්ම සිදු කළ නොහැකි වේ.
- ක්‍රියා කිරීමේ පහසුව — මෙම යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට කුමන ප්‍රමාණයේ කායික ශක්තියක් හා කුසලතාවයක් අවශ්‍ය වේද යන්න.
- ආරක්ෂක තත්වය - අප්‍රවේශමෙන් හෝ විධාමවන් යුතුව මෙම යන්ත්‍රය ක්‍රියාත්මක කළහොත් ඇතිවන අනතුරු කවරේද?
- ඔබ විසින් ම යන්ත්‍රය ක්‍රියාකර බලන්න යන්ත්‍රය විනාඩි 20 — 30 ක පමණ කාලයක් තුළ ක්‍රියාත්මක කොට තබන්න. යන්ත්‍රය පණගැන්වීමට අමතරව එහි වේගය වෙනස් කරන අයුරු සහ නතර කරන අයුරුද සොයා බලන්න.
- කුමක් හෝ යන්ත්‍රයක් පිළිබඳව ආදර්ශනයක් පැවැත්වීම සඳහා ඔබගේ ගොවිපල අවශ්‍ය යයි ඉල්ලීමක් කළහොත් ඒ සඳහා නොපැකිලව ඉඩ දෙන්න. එමගින් යන්ත්‍ර පිළිබඳව වඩා වැඩි දැනුමක් හා විශ්වාසයක් ඔබට ඇති කරගත හැක. එවැනි ආදර්ශනයක් පැවැත්වූ පමණින්ම ඔබ ඒ යන්ත්‍රය අනිවාර්යයෙන්ම මිළදී ගත යුතු නැත.

### නඩත්තු හා අළුත් වැඩියා පහසුකම්

- යන්ත්‍රයේ සෑම කොටසක්ම හොඳින් පරීක්ෂා කරන්න. වැඩි වශයෙන් කරදර ගෙන දීමට ඉඩ ඇති සහ නිතර අළුත් කළ යුතුයැයි හැඟෙන කොටස් මොනවාදැයි එමගින් ඔබට නිශ්චය කර ගත හැක.
- නඩත්තු හා අළුත් වැඩියා කිරීම් වලදී ඔබටම කළ හැකි කොටස කුමක්දැයි සැකහැර දැනගන්න.
- විකිණීමෙන් පසු සැලසෙන සේවා පහසුකම් ස්ථිර කර ගන්න.
- ඔබ ප්‍රදේශයේ පිහිටි වැඩපලකින් හෝ ගරාජයකින් කුමන ආකාරයක අළුත් වැඩියාවන් ඔබගේ යන්ත්‍රය සඳහා ලබා ගැනීමට හැකි වේද යන්න සොයා බලන්න.

### මිළදී ගත යුතු ආකාරය

සම්පූර්ණ මුදල එකවරම ගෙවීමෙන් හා කොටස් වශයෙන් මුදල් ගෙවීමෙන් ඇතිවිය හැකි වාසි අවාසි සසඳා බලන්න. මුදල් ණයට ගෙන හෝ එක්වරම ගෙවීමෙන් විශාල වාසියක් සැලසේදැයි යන්න සොයා බලන්න. විශේෂයෙන් බැංකුවක් මගින් මුදල් ණයට ගත හැකි ආකාරය විමසා බලන්න. යන්ත්‍ර මිළදී ගැනීම සඳහා පිහිටුවා ඇති වෙනත් ණය දෙන ආයතන හෝ සංවිධාන වෙත ගොස් සාකච්ඡා කර බලන්න.

වගකීමේ කාලය ස්ථිර කරගන්න. යන්ත්‍රයේ කුමන කොටස කොටස්සඳහා වගකීමේ සහතිකය අදාල වේද යන්න සොයා බලන්න. ඔබ ලබාගන්නා වගකීමේ සහතිකයේ මෙය පැහැදිලිව සටහන් කර ඇද්දැයි විමසිලිමත් වන්න.

යන්ත්‍රය ක්‍රියාකරවීම හා කොටස් පිළිබඳ විස්තර අඩංගු අත් පොත අමතක නොකර ලබාගන්න. සමහර වෙළඳසැල් මෙවැනි අත් පොත් අසුව දෙන බවට පොරොන්දු වන නමුත් ඒවා කිසිම දිනක ලබා නොදේ. එම නිසා සම්පූර්ණ මුදල ගෙවීමට ප්‍රථම අදාල පොත් පත් නිසි පරිදි ලබාගන්න.

ඔබ විසින් මිළදී ගන්නා යන්ත්‍රය කාර්යක්ෂම ලෙස භාවිතා කරමින් නිවැරදිව නඩත්තු කරන්නේ නම් ඔබගේ මිත්‍රයින් හා අසල්වැසි ගොවීන්ද එවැනි යන්ත්‍ර මිළදී ගැනීමට පෙළඹෙනු ඇත. විකිනීමෙන් පසු ඇතිවන සේවය ඉතාමත් කාර්යක්ෂම ලෙස ලබාගැනීමට ද මෙය ඉමහත් රුකුලක් වනු ඇත. හේතුව එකම ප්‍රදේශයේ එකම වර්ගයේ යන්ත්‍ර කිහිපයක් ඇතිවිට සේවා පහසුකම් මෙහෙයවීම හා ක්‍රියාත්මක කිරීම වඩාත් පහසුවන බැවිනි. වගකිව යුතු වෙළඳ සමාගම් මෙවැනි තත්වයන් ඉතා අගේකොට සලකන බැවින් ඔබටද එයින් අගනා මෙහෙයක් ලබාගත හැක.

යන්ත්‍රය ඔබ වෙත භාරදෙන අවස්ථාවේදී එයට හිමි සියලුම උපාංග හා අමතර කොටස් ද ඒ සමග සැපයිය යුතුය. යන්ත්‍ර පරීක්ෂා කිරීමේ කාර්යය(Test operation) දෙපාර්ශවයම ඉදිරියේ කළ යුතුය. යන්ත්‍රය පිළිබඳ යම් ගැටලුවක් හෝ අපැහැදිලි දෙයක් ඇත්නම් එය නිරාකරණය කර ගැනීමටද මෙම අවස්ථාව යෝග්‍ය වන්නේය.

"The years of anxious searching in the dark ; . . . . . . and the final emergence into light — Only those who have experienced it, can understand it ".

— *Albert Einestien* —